ලංකාදීප

2013 අගෝස්තු මස 8 වැනිදා බ්‍රහස්පතින්දා

# කතිකාවත් පනතට පුළුල් අවධානයක් යොමු කළ යුතුයි



අග්ගමහා පණ්ඩිත කොටුගොඩ ධම්මාවාස අනු නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාව පැවැත්වූ අවස්ථාව.

## ආචාර්ය ඉත්තෑපානේ ධම්මාලංකාර අනු නාහිමියෝ කියති

දිගු කාලයක් තිස්සේ සාකච්ඡා වෙමින් පවතින කතිකාවත් පනත සම්බන්ධයෙන් පුළුල් අවධානයක් යොමු කළ යුතු බවත් සසුනේ ඇතැම් අංශ අතර විනය සම්බන්ධයෙන් පැනනැගී ඇති මතභේද විසඳා ගැනීමට එය උපකාරී වන බවත් ආචාර්ය ඉත්තෑපානේ ධම්මාලංකාර කෝට්ටෙ පාර්ශ්වයේ අනුනාහිමියෝ පැවසූහ.

අනුනාහිමියන් එසේ කීවේ කතිකාවත් පනත පිහිටුවීමට ගතයුතු මග සම්බන්ධයෙන් කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේදී ඉකුත්දා පැවැති සාකච්ඡාවකදීය.

ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක කාර්යාලය සහ උරුමයක උල්පත පදනම එක්ව මෙම සාකච්ඡාව සංවිධාන කළේය.

ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතා කැඳවා තිබූ මෙම සාකච්ඡාව අග්ග මහා පණ්ඩිත කොටුගොඩ ධම්මාවාස අනුනායක හිමියන්ගේ සභාපතිත්වයෙන් පැවැත්විණි. කෝට්ටෙ නාග විහාරාධිපති මාදුළුවාවේ සෝභිත, මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්දරතන, මහාචාර්ය කොටපිටියේ රාහුල, ශාරිපුත්ත විද්‍යාපීඨාධිපති කොටගම වාචිස්සර, අමරපුර සංඝ සභාවේ ලේඛකාධිකාරී බ්‍රාහ්මණවත්තේ සීවලී සහ වලේබොඩ ගුණසිරි හිමිවරුද මෙම අවස්ථාවට සහභාගී වූහ. එහිදී අදහස් පළ කළ ඉත්තෑපානේ ධම්මාලංකාර අනුනාහිමි පැවසුවේ පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට නම් තම තමන්ට අවශ්‍ය නිර්දේශ එක් එක් නිකාය විසින් ඉදිරිපත් කළ යුතුව ඇති බවයි. නාග විහාරාධිපති මාදුළුවාවේ සෝභිත හිමියන් කීවේ කතිකාවත් පනත බල ගැන්වෙන ආකාරය ගැන මෙයට වඩා විග්‍රහ කළ යුතු අතර මෙම සාකච්ඡාවට ඉදිරියේදී ආගමික කටයුතු අමාත්‍යාංශය ද ත්‍රෛනිකායික මහා සංඝරත්නයේ නියෝජනය ද අවශ්‍ය බවයි. කතිකාවත පනත අනුව ඇති විය හැකි පසුබිම පිළිබඳව දීර්ඝ වශයෙන් අදහස් දැක්වූ සෝභිත හිමියෝ සියලු පැති සලකා බලා ශාසනයට ගැලපෙන ආකාරයට ක්‍රියා කිරීම අවශ්‍ය බවයි. පනත ඉදිරියට ගෙන යාමට නම් ජනාධිපතිවරයා ඇතුළු රජයේ මැදිහත්වීම අවශ්‍ය බවද සෝභිත හිමියෝ කීහ.

ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතා උරුමයක උල්පත පදනම මගින් මෙරට බෞද්ධ පුනරුදය උදෙසා ගත හැකි පියවර ගැන අදහස් දැක්වූ අතර ඇතිවී තිබෙන අන්තවාදී ආගමික අදහස් මධ්‍යස්ථ මට්ටමට ගෙන, රටට අවශ්‍ය මග පෙන්වීම ඇති කරන්නට මහා සංඝ රත්නය සතු වගකීම ඉතාමත් පුළුල් බව කියා සිටියේය. ගැටලු පැන නැගී ඇති අවස්ථාවල කතිකාවත් ඇති කර ආගම නිසි මගට ගෙන ඇති බව සඳහන් කළ මිලින්ද මොරගොඩ මහතා සංඝරත්නය සම්බන්ධව ක්‍රියා කළ යුතු ආකාරය නිකායික මහ නාහිමිපාණන් වහන්සේලාගේ උපදෙස් පරිදි තීරණ ගත යුතු අතර කතිකාවත පනත අවශ්‍ය ද නැද්ද යන්න ප්‍රථමයෙන් තීරණය කළ යුතු බවද පෙන්වා දුන්නේය.